777

# දේශපාලන ප්‍රචාරණය සහ ගීත මාධ්‍යය

## (ශ්‍රී ලංකාවේ විරෝධාකල්ප ගීත ප්‍රසංග ඇසුරෙන් කෙරෙන ක්ෂේත්‍ර පර්යේෂණ විමසුමකි)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 777 |
| වර්ග අංකය: | |



ප්‍රදීප් ධර්ම ශ්‍රී දසනායක
FGS/M/MSSC/2004/07
ජන සන්නිවේදනය
සමාජීය විද්‍යාපති උපාධිය
කැලණිය විශ්ව විද්‍යාලය

# නිබන්ධ සාරාංශය

ගීතය යනු සෞන්දර්යාත්මක මාධ්‍යයකි. නමුත් එකී සෞන්දර්යාත්මක මාධ්‍ය විරෝධාකල්ප ජනිත කිරීමට හා සමාජගත කිරීමට යොදාගෙන ඇති අයුරු ශ්‍රී ලංකාවේද විරෝධාකල්ප ගීත ප්‍රසංග ආශ්‍රිතව කෙරුණු ක්ෂේත්‍ර පර්යේෂණ විමසුමක් ඇසුරෙන් තහවුරු කිරීම මෙම නිබන්ධනයේ මූලික අරමුණයි.

එහිදී ගීත මාධ්‍ය විවිධ දාෂ්ඨි කෝණ වලින් සමාජ විද්‍යාත්මකව හදුනාගැනීමත්, විරෝධාකල්ප සාහිත්‍ය ඓතිහාසිකව විහිදුණු අයුරු සන්නිවේදන සංකල්ප ඔස්සේ හදුනාගැනීමත්, විරෝධාකල්ප සාහිත්‍ය ලෝක ගීත සාහිත්‍යය හා සිර කදවුරු තුළ ව්‍යාප්ත වූ අයුරුත්, එය දේශීය විරෝධාකල්ප ගීත ප්‍රසංග ඔස්සේත් ප්‍රචලිත වූ අයුරුත් මෙම නිබන්ධයේ මූලික පරිච්ඡේද ඔස්සේ විස්තර කර ඇත.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ දේශපාලන ගීත ප්‍රසංග පිළිබදව මෙම ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යනයේදී වැඩිපුර අවධානය යොමු කර ඇති අතර ගීතය නම් වූ සෞන්දර්යවාදී මාධ්‍යය දේශපාලනික අරමුණු ප්‍රචලිත කිරීම හා සමාජගත කිරීම උදෙසා යොදාගත හැකි බව තහවුරු කිරීම එහි සංකල්පීය තලයේ අරමුණයි.

විකල්ප විරෝධාකල්පීය සාහිත්‍යමය ප්‍රවනතා ඔස්සේ එකී දේශපාලනික අරමුණු සමාජගත කිරීම සමාජයට ධනාත්මක මට්ටමක මෙන්ම ඍණාත්මක මට්ටමක බලපෑම්ද ඇති කර තිබුණි. පසුකාලය වන විට අනිවාර්ය සංස්කෘතිකාංගයක් බවට පත්වූ විරෝධාකල්පය මෙන්ම ගීතය සහ දේශපාලනය යනු එකිනෙකින් වෙන් කළ නොහැකි ක්ෂේත්‍ර 2ක් බවත් කිසිදු කලා මාධ්‍යයට දේශපාලනයෙන් තොරව පැවතිය නොහැකි බව තහවුරු කිරීම ක්ෂේත්‍රගත පර්යේෂණයක් ඔස්සේ කෙරුණු මෙම නිබන්ධය මගින් තහවුරු කිරීමට උත්සහ දරා ඇත.

මුලින් සෞන්දර්යවාදි මාධ්‍යක් ලෙස හදුනාගත් ගීතයට දාධ්‍ය විෂය වී තිබුණේ ආදරය-ලිංගිකත්වය-කුතුහලය-ඕලාරික ප්‍රේමය වැනි කාරණාය.නමුත් ගීතයේ මෙකී ගමන්මග වෙනස් කරමින් එහි අර්ථාන්විත හා වින්දනාත්මක පාර්ශවයේ ගමන් මග වෙනස් කරනු ගැබුවේ විරෝධාකල්ප ගීත සාහිත්‍යයි.එහි අන්තර්ගතය විරෝධාකල්පය වූවත් සමාජයට තවත් ඕවනිතාර්ථ ජනිත කරවීම එය සමත් විය. හුදු වින්දනාත්මක පාර්ශවයෙන් ඔබ්බට ගොස් කිසියම් වෙනස් සමාජ පරිවර්තනයක් සඳහා ගීතයෙන් මතවාදී දායකත්වයක් සැපයු බවත් එය ගීතයෙන් දේශපාලන අදහස් සන්නිවේදනය කිරීමත් බවත් ලාංකීය ගීත ප්‍රසංග ඔස්සේ කෙරුණු මෙම ක්ෂේත්‍රගත පර්යේෂණයේ මූලික අරමුණ විය.